194815
20/11/2009
Rs. 5000/-

# බෞද්ධ විනය සම්ප්‍රදායය තුළ අන්තර්ගත අනුප්‍රාප්තික අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය

විජයදාස රාජපක්ෂ
GS / Mphil / BC / 3549 / 08

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධය

2009

Libary - USJP
194815
194815

**බෞද්ධ විනය සම්ප්‍රදායය තුළ අන්තර්ගත අනුප්‍රාප්තික අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය**

විජයදාස රාජපක්ෂ

**උපාධි අපේක්ෂකයාගේ ප්‍රකාශය.**

මේ නිබන්ධයේ අන්තර්ගතය ආචාර්ය ගරු නායිම්බල ධම්මදස්සි හිමියන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ අනෙක් ආයතනයකට හෝ වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නො කරන ලද බවත් සහතික කරමි.

දිනය:- 09.09.2009

අත්සන:- 09.09.2009.

## බෞද්ධ විනය සම්ප්‍රදායය තුළ අන්තර්ගත අනුප්‍රාප්තික අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය

### උපදේශක හිමියන්ගේ ප්‍රකාශය.

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

දිනය:- 09.09.2009

අත්සන:- 2009/09/09

ජයවර්ධනපුර
13 MAR 2009

ආචාර්ය ගරු නායිම්බල ධම්මදස්සී හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.

# බෞද්ධ විනය සම්ප්‍රදායය තුළ අන්තර්ගත අනුප්‍රාප්තික අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය

පටුන


| පරිච්ඡේදය | පිටුව |
|---|---|
| 1. හැඳින්වීම | 01-28 |
| 2. නූතන නීතිවිද්‍යාව සහ බෞද්ධ නීතිය | 29-56 |
| 3. විහාරාධිපති ධුරයේ සංවර්ධනය | 57-86 |
| 4. අද්‍යතන අනුප්‍රාප්තික නීතියට පදනම් වූ බෞද්ධ විනය I | 87-99 |
| 5. අද්‍යතන අනුප්‍රාප්තික නීතියට පදනම් වූ බෞද්ධ විනය II | 100-116 |
| 6. අද්‍යතන අනුප්‍රාප්තික නීතියට පදනම් වූ බෞද්ධ විනය III | 117-238 |
| 7. අද්‍යතන අනුප්‍රාප්තික නීතියට පදනම් වූ බෞද්ධ විනය IV | 239-299 |
| 8. අද්‍යතන අනුප්‍රාප්තික නීතියට පදනම් වූ බෞද්ධ විනය V | 300-412 |
| 9. නිගමනය | 413-444 |
| ආශ්‍රිත ග්‍රන්ථ | 445-465 |

# උපකාරානුස්මෘති

නීති වෘත්තියේ නිරතව සිටින මා හට බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ සහ විහාර දේවාල දේපල සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට සිදු වූ අවස්ථා එමටය. එවන් අවස්ථාවන්හි මා සිත නිරන්තරයෙන් ඇදීගියේ බෞද්ධ විනය රීති පද්ධතිය වෙතය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පාලි විනය පිටකය ගැඹුරින් හැදෑරීමට අවස්ථාව උදා විය. වත්මන් සංඝ සමාජයට මහත් සේ උපකාරී වෙතැයි සිතන වත්මන් මාතෘකාව යටතේ දීර්ඝ පර්යේෂණයකින් අනතුරුව මෙම නිබන්ධනය නිර්මාණය කිරීමට මා හට හැකි විය.

මෙම පර්යේෂණය ප්‍රශස්ථ මට්ටමකින් සිදු කර මෙම නිබන්ධය දර්ශණපති උපාධිය සඳහා යොමුකරවීම පිණිස මා හට අවශ්‍ය උපදෙස් නොමදව ලබාදුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශ ප්‍රධාන ආචාර්ය ගරු නායිම්බල ධම්මදස්සි ස්වාමීන්ද්‍රයාණන්වහන්සේට මම නමස්කාර පූර්ව ස්තුතිය ප්‍රථමයෙන් පුද කරමි.

දෙවනුව මෙම භාරදූර කටයුත්ත සඳහා මා දිරිමත් කල සහ ගුරුහරුකම් ලබාදුන් මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාටද, එසේම මා විසින් පවත්වන්නට යෙදුන සම්මන්ත්‍රණයන්හිදී වටිනා උපදෙස් ලබාදුන් මහාචාර්ය ඔලිවර් අබේනායක මහතාටද මම හෘදයාංගම ස්තුතිය පුද කරමි.

විජයදාස රාජපක්ෂ

# හැකුළුම් (Abbreviations)

| | |
|---|---|
| බු.ජ.මු. | - බුද්ධ ජයන්ති මුද්‍රණය |
| හේ.මු. | - හේවාවිතාරණ මුද්‍රණය |
| දී.නි. | - දීඝ නිකාය |
| C.A. Minute | - Court of Appeal Minutes |
| C.A.L.R. | - Colombo Appellate Law Report |
| C.L.R. | - Ceylon Law Review |
| C.L.W. | - Ceylon Law Weekly |
| C.W.R. | - Ceylon Weekly Report |
| Ch. Div | - Chancery Division |
| J.R.A.S | - Journals of Royal Asiatic Society |
| N.L.R | - New Law Report |
| P.B.S | - Buddhist Publication Society |
| P.I.P.B.S | - Post Graduate Institute of Pali and Buddhist Studies |
| P.T.S | - Pali Text Society |
| S.C. Minute | - Supreme Court Minutes |
| S.C.C. | - Supreme Court Circular |
| S.L.R. | - Sri Lanka Law Report |
| Vand. | - Vandestraten Report |
| Voet | - Johannis Voet, Commentarius ad Pandectas |

## සාරාංශය

"විනයො නාම සාසනස්ස ආයු - විනයෙ ඨිතෙ සාසනං ඨිතං හෝති", "විනය නම් ශාසනයේ ආයුෂය යි. විනය මත මැ ශාසනය පිහිටා තිබේ" යනුවෙන් සමන්තපාසාදිකාවෙහි සඳහන් ව ඇත්තේ විනය පිරිහීමක් ඇති වුවහොත් එය ශාසනයෙහි පිරිහීමට පමණක් නොව මානව වර්ගයා ගේ පැවැත්මේ ද පිරිහීමට හේතුවන බව මනාව අවබෝධ කොට ඇති හෙයින් ය. රටක නීතිය අවසන් වූ විටක කෲරත්වය ආරම්භ වේ. (Where the law ends, tyranny begins) එය කැලයේ නීතිය මතුවීම හෙවත් අරාජිකත්වයට පත්වීම ලෙස සැලකේ. සමහරුන් නීතියට ගරුකරන්නේ නීති උල්ලංඝනය කළහොත් ලැබෙන ප්‍රතිඵල භයානක වන හෙයිනි. එහෙත් සමහරුන් නීතියට ගරුකරන්නේ නීතිගරුක අයෙකු ලෙස සමාජයේ පෙනී සිටීම මගින් ලැබෙන අභිමානය නිසා ය. තවත් සමහරුන් නීතියට ගරු කරන්නේ සභ්‍යත්වය අගයන නිසා ය. කුමන හේතුව මත වුව ද නීතියට ගරු කිරීමෙන් නීතියේ ආධිපත්‍යය සිංහාසනාරූඪ වේ. එසේ වුවහොත් සමානාත්මතාව සහ සාධාරණත්වය පිළිබිඹු වන දැහැමි සමාජයක් රට තුළ බිහිවනු ඇත. එහෙත් විනය ඊට වඩා උත්තරීතර ය. විනය කඩ කළ විට රටේ නීතිය ක්‍රියාත්මක නුනත් හෘද සාක්ෂිය නමැති කැඩපත ඉදිරියේ ඔහු අසරණයෙකු හෝ අවම වශයෙන් පසුතැවෙන්නෙකු බවට පත්වේ.

නීතිවිරෝධී සහ සමාජ විරෝධී නොවූ, සමාජය තුළ චිරාත් කාලයක් අනුගමනය කොට ඇති සිරිතක් හෝ සම්ප්‍රදායයක් නීතියක් සේ පිළිගැනීමට රෝම, ලන්දේසි සහ ඉංග්‍රීසි අධිකරණ ක්‍රමයයන් රුචියක් දක්වා ඇති බව සනාථ වූ සත්‍යයකි. අපේ රටේ මුල් බැසගත් අධිකරණ රටාව එම නීතිවල මූලයන් මත ගොඩනැගී ඇති බව ද පිළිගත් සත්‍යයකි. රෝම ලන්දේසි නීතිය සහ ඉංග්‍රීසි නීතිය ක්‍රියාත්මක වූ සමාජය තුළ දී එම සමාජවල අනුගමනය කරන ලද්දා වූ පැරණි සිරිත් සහ සම්ප්‍රදායයන් ද අධිකරණය විසින් නීත්‍යානුකූලභාවයක් ආරෝපණය කළ ලෙසින් බෞද්ධ විහාර හා

දේවාලගම් පිළිබඳ ගැටළු මතු වූ විට බෞද්ධ දර්ශනය මත පදනම් වූ විනය රීතිවලට නීත්‍යානුකූලභාවයක් ආරෝපණය කර ඇත.

සිවුරට සහ පාත්‍රයට පමණක් හිමිකම් කියනු ලබන බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ බෞද්ධ ආයතන සම්බන්ධයෙන් විනය රීති නීතිගත කිරීම බෞද්ධ දර්ශනයට අනුව කොතරම් දුරට සාධාරණ ද යන්න ප්‍රශ්න කිරීමට කෙනෙකුට අයිතියක් ඇතත්, වසර 2500 කට වඩා වැඩි කාලයක් වැටි වැටී නැගිටිමින් සාර්ථක සමාජ මෙහෙවරක යෙදෙමින් සිටින භික්ෂු ශාසනය සහ එය පවත්වාගෙන යාමට උපකාරී වන ආයතන ආරක්ෂා කරගැනීමේ වගකීමක් රටකට සහ සමාජයට ඇත. එමනිසා හුදෙක් නිවන් මාර්ගය ප්‍රාර්ථනා කරමින් බෞද්ධයන් සියලූ දෙනා ත්‍රිලක්ෂණය මෙනෙහි කරමින් බවුන් වැඩීම ආරම්භ කළහොත් එම පරම්පරාවේ අවසානයත් සමග ශාසනය ද අවසන් වේ. එය එසේ සිදුවිය යුත්තක් නොව ශාසනය මත රැඳි සිටිමින් ක්‍රමානුකූල ලෙස පුරුදු පුහුණු කරනු ලබන දාන, ශීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍යක්‍රියා තුළට අනුගත වීම අවශ්‍ය කරුණකි. ඒ සඳහා ඉතාමත් වැදගත් ව බලපවත්නා වූ සාධකය ශාසනයේ පැවැත්ම මිස අන් කිසිවක් නොවේ.

මා විසින් කරන ලද පර්යේෂණයෙන් සනාථ වන්නේ බෞද්ධ අනුප්‍රාප්තික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අධිකරණ විසින් අගය කළ යුතු ප්‍රයත්නයක් දරා ඇති බව ය. ඊට පදනම් වී ඇත්තේ බෞද්ධ දර්ශනය තුළ ම ජනිත වී වර්ධනය වූ විනය රීති පද්ධතිය වේ. මෙම නිබන්ධනයේ අන්තර්ගත වී ඇති සහ අධිකරණය විසින් ද පිළිගෙන ඇති විනය රීති ඒකාබද්ධ කොට විනය රීති සංග්‍රහයක් සකස් කිරීම සහ එකී විනය කටයුතු පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය උත්තරීතර සංඝාධිකරණයක් වෙත පැවරීමට කටයුතු කිරීම මාගේ මෙම ප්‍රයත්නයේ අග්‍රඵලය ලෙස සලකමි. එම රීති සංග්‍රහය චිරාගත බෞද්ධ දර්ශනයට ගැලපෙන ලෙසින් බෞද්ධ කතිකාවතක් ලෙස හඳුන්වාදීම වඩාත් උචිත බව මාගේ විශ්වාසය වේ.



පුස්තකාලය

පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## ඓතිහාසික පසුබිම

1.1 බෞද්ධ චින්තනය තුළ ගැබ් වී ඇති නිති රීති පිළිබඳව සාකච්ඡා කිරීමට පෙරාතුව බුදුදහම සහ එහි ඓතිහාසික පසුබිම පිළිබඳව අවබෝධයක් ලබාගැනීම අවශ්‍ය වෙයි. ක්‍රි.පූ. 6 වන සියවස ඉන්දීය ඉතිහාසයෙහි එතෙක් පැවති ගතානුගතික පාරම්පරික සම්ප්‍රදායයන් බිඳ හෙළමින් නව සම්ප්‍රදායයන් රැසක් බිහිකළ සුවිශේෂී යුගයක් ලෙස හැඳින්විය හැකි ය. මෙසේ නව සම්ප්‍රදායයන් බිහි වීමට මූලික වූ සාමාජික, ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතික විපර්යාසයන් ඉන්දීය සමාජය තුළ ආරම්භ වනුයේ, මෙයට සියවස් දෙකකට පමණ පෙර සිට ය. ඒ ක්‍රි.පූ. 8 වන සියවසේ දී සිදු වූ පෞරව රාජ්‍යයේ බිඳවැටීමත් සමග ම ස්වකීය බල ප්‍රදේශ ව්‍යාප්තිය සඳහා සටන් වැදුණු ප්‍රාදේශීය රාජ්‍යයන් ගේ බල අරගලය තුළින් බිහිවුණු නව නාගරික සංස්කෘතිය ද, නාගරිකයන්ට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම තුළින් බිහි වූ වෙළඳ ආර්ථිකය ද බල අරගලය තුළින් බිහිවුණු අධිරාජ්‍යවාදී ස්වරූපය ගත් නව රාජ්‍ය පාලනයන් ද ඉන්දීය ඉතිහාසයේ නව පරිච්ඡේදයක් ඇරඹීමට සමත් වී ඇත. දේශපාලනික ආර්ථික හා සංස්කෘතික විශාල විප්ලවයක් ඉන්දීය සමාජය තුළ මේ යුගයේ සිදුවූවා සේ ම ආගමික හා දාර්ශනික වශයෙන් ද, විශාල විප්ලවයක් මේ යුගයේ සිදු වී ඇත. මෙම විප්ලවයෙහි ප්‍රතිඵලයක් ලෙස, ක්‍රි.පූ. 1600 දී[1] පමණ ආරම්භ වී ක්‍රමික ව දියුණුවට පත් ඉන්දීය සමාජයෙහි අධිපතිභාවයට පත් ව තිබූ බ්‍රාහ්මණ ආගමික සාම්ප්‍රදායික චින්තනය යටපත් කරමින් නව මගක ගමන් ගත් ශ්‍රමණ ආගමික සම්ප්‍රදායයෝ ඉන්දීය චින්තන ඉතිහාසය තුළ නව පිටුවක් පෙරළීමට සමත් වූ දාර්ශනික වශයෙන් මහත් සේ අගය කළ හැකි චින්තන දහරාවන් රැසක් බිහි කළහ. මෙසේ බිහි වූ චින්තන තුළ විවිධත්වයෙන් යුත් දාර්ශනික අදහස් ගැබ් වී ඇති අයුරු එම චින්තනයන් දෙස විමසුම් ඇසින් බැලීමෙන් පැහැදිලි වෙයි. ආජීවක, පරිබ්‍රාජක, නිඝණ්ඨ, භෞතිකවාද, සංශයවාද, උපනිෂද්, සාංඛ්‍ය, ජෛන, සහ බුදුදහම ආදී චින්තනයන් තුළ එකිනෙකට පටහැනි දර්ශනවාද ඇතුළත් ව ඇත. ඉහත නම් සඳහන් කළ චින්තනයන් අතරින් ජෛන දහමට සහ බුදුදහමට අද්විතීය ස්ථානයක්

1. A.K. Warder, Indian Buddhism, Mortilal Banarsidass Publishers, 1991, P 18

හිමි වෙයි. ඒ බව ඉන්දිය චින්තනය තියුණු විවේචනයට ලක් කළ බටහිර දාර්ශනිකයෙක් වූ ඇල්බට් ස්විට්සර් (Albert Schweitzer) බුදුදහම පිළිබඳව කර ඇති ප්‍රකාශනයෙන් වඩාත් තහවුරු වේ.

"සදාතනික වටිනාකමකින් සහ උසස් ම සදාචාරාත්මක වූත් බුද්ධිමත් විද්‍යාවක් සත්‍ය ලෙස ම බුදුන් වහන්සේ දේශනා කර ඇත. එය ඉන්දියාවට පමණක් සීමා නොවෙයි. මුළු මහත් මිනිස් වර්ගයාට ම පොදු වූවකි. බුදුන්වහන්සේ වනාහි මේ මිහි තලය මත බිහි වූ උසස් ම සදාචාරාත්මකවූත් බුද්ධිමත්වූත් මිනිසා වෙයි.'[2]

## සිදුහත් කුමරා

1.2 බෞද්ධ පෙළ පොත්වලට අනුව උතුරු ඉන්දියාවෙහි රාජධානියක සිහසුනට උපතින් ම උරුමකම් ලබමින් උපන් සිදුහත් කුමරාට සියළු සුඛ විහරණයන්ගෙන් සහ සියළු ඓශ්වර්යයන්ගෙන් ආඪ්‍ය වූ ජිවිතයක් කුඩා කල සිට ම ගත කිරීමට ලැබුණි. සිදුහත් කුමරා වයසින් මුහුකුරා යත් ම තමන් ලබන සුඛ විහරණයන්හි සහ ඓශ්වර්යයන්හි අර්ථ රහිත බවක්, ශූන්‍ය බවක් අවබෝධ කරගත්තා සේ ම පරමාර්ථ වශයෙන් මෙම සුඛ විහරණයන්හි ඇති අතෘප්තිමත් බවත් අවබෝධ කර ගති. පරමාර්ථ වශයෙන් මෙම ජිවිතයෙහි ලබන අතෘප්තිමත් බවින් මිදී වඩා ප්‍රණීත පරම සුඛයක් අවබෝධ කරගැනීම් වස් රජ මාළිගය ද, ස්වකීය ආදරණීය දරුවා සහ බිරිය ද අත්හැර සිදුහත් කුමරා පරමාර්ථ සත්‍ය ගවේෂණය සඳහා නික්මුණි. සමාජමය සියළු බැඳීම්වලින් මිදී නික්මුණු එතුමා තත්කාලීන ශාස්තෘවරු ගමන් ගත් මග අනුගමනය කරමින් පරම සැපත ළඟාකර ගැනීමේ මාර්ගය ලෙස සිරුරට දැඩි දුක් දෙන විවිධ ව්‍රත සමාදන් වී ඇත. මෙය අත්තකිලමථානුයෝගය ලෙස හඳුන්ව යි. මෙසේ සය අවුරුද්දක් මුළුල්ලේ අනුගමනය කළ අත්තකිලමථානුයෝගි ක්‍රමයෙන් හෙවත් ශරීරයට දැඩි දුක්ගෙන දෙන දුෂ්කර ක්‍රියා හේතුකොටගෙන සිය ශරීරය දැඩි අපහසුතාවට පත්වූවා මිස තමන් බලාපොරොත්තු වූ ඥානය අවබෝධ කරගැනීමට නොහැකි වූයෙන්, එහි ඇති නිශ්ඵල බව තේරුම් ගෙන එම මාර්ගය අතහැර දැමී ය. සිදුහත් කුමරා කුඩාකල සිට ම අත්විඳිනු ලැබූ ශරීරයට දැඩි සැප දෙන කාමසුඛල්ලිකානු යෝගය අනුගමනය කිරීමෙන් ද තමන් බලාපොරොත්තු වූ ඥානය අවබෝධ කරගත නොහැකි බව අවබෝධ කරගත් එතුමා එම මාර්ග දෙක ම

2. "In this sphere he gave expression to truths of everlasting value and advanced the ethics not of India alone but of humanity. He was one of the greatest ethical man of genius ever bestowed upon the world." Albert Schweitzer, Indian Thought and Its Development, trans. Mrs C.E.B. Russel, Adam and Charless Bank Ltd. London, 1956, P 117

අන්තගාමී මාර්ගයන් ලෙස හඳුන්වා ප්‍රතික්ෂේප කළහ. අනතුරු ව ස්වකීය ජීවිතයේ ලැබූ අත්දැකීම් පදනම් කරගෙන අන්තගාමී මාර්ගයන්ගෙන් බැහැරව නව මගක් ලෙස මධ්‍යම ප්‍රතිපදාව තෝරාගනු ලැබූහ. මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරමින් ලොව ඇති යථාර්ථය (Reality - to see things as they are) අවබෝධ කරගනිමින් බුද්ධත්වයට පත් වූහ.

බුද්ධත්වය ලැබීම

1.3 වසර ගණනාවක් මුළුල්ලේ පූර්ණ කැපවීමකින් සිදුකරනු ලැබූ ගවේෂණයෙහි අවසාන ප්‍රතිඵලය ලෙස බුද්ධත්වය හැඳින්විය හැකි ය. බුද්ධත්වයෙන් අනතුරුව තමන් අවබෝධ කරගත් ධර්මය බොහෝ දෙනා ගේ හිත සුව පිණිස දේශනා කිරීම ආරම්භ කළ බුදුන්වහන්සේ බුද්ධත්වයේ සිට පරිනිර්වාණය තෙක් වසර 45 ක් මුළුල්ලේ දේශනා කළ දෑ අද අපි බුදුදහම හෙවත් බෞද්ධ දර්ශනය නමින් හඳුන්වමු. වසර 45ක් වැනි දීර්ඝ කාලයක් මුළුල්ලේ දේශනා කළ ධර්මය අති විශාල වූවකි. එම ධර්මය පරිශීලනයෙහි පහසුව සඳහාත්, දිගුකල් පැවැත්ම සඳහාත්, වර්ගීකරණය කොට සූත්‍ර, විනය සහ අභිධර්ම වශයෙන් පිටක තුනකට කොටස් කර ඇත. මෙය පාලි භාෂාවෙන් තිපිටක යනුවෙන්ද, සංස්කෘතික භාෂාවෙන් ත්‍රිපිටක යනුවෙන් ද හඳුන්වයි. මෙම පිටක තුන ම අයත් ග්‍රන්ථ සමුදාය එක්තැන් කළ විට එය අනෙකුත් සියලූ ම ආගමික සාහිත්‍යයන්ට වඩා විශාලත්වයෙන් යුක්ත වෙයි. එසේ ම ත්‍රිපිටකය තුළ මිනිසාගේ ස්වභාවය, මිනිස් චර්යාව, මිනිස් සිතුවිලි, මිනිසාගේ අපේක්ෂා මෙන් ම මිනිසා වටා ගොඩ නැගී ඇති අවට පරිසරය පිළිබඳව ආදී කොට ඇති විවිධ විෂයන්ගෙන් සංයුක්ත වෙයි. නූතනයේ අප හඳුන්වන සමාජ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව, ආචාර ධර්ම විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, ස්වභාව ධර්ම විද්‍යාව, විශ්වය පිළිබඳ විද්‍යාව (Cosmology), ආර්ථික විද්‍යාව සහ දේශපාලන විද්‍යාව ආදී විවිධ විෂයයන්ට අදාළ කරුණු බෞද්ධ දර්ශනය තුළ ඇතුළත්ව ඇත. ඒ අනුව "ආගම යනු සදාචාරයටත් දේවධර්මයටත් පමණක් සීමා වී නැත."[3] යනුවෙන් රුඩෝල්ෆ් ඔටෝ (Rudolf Otto) කර ඇති ප්‍රකාශය ඉතාමත් ම උචිත වන්නේ බුදුදහමට බව මැනැවින් පැහැදිලි වෙයි.

3. "Religion is not in vassalage either to morality or theology, ethos or telos..." Rudolf Otto, The Idea of the Holy, A galaxy book, New York, 1958, P. 136

## බෞද්ධ දර්ශනය

1.4 වත්මන් වියත්හු ආගම් සහ දර්ශන යන විෂයයන්හි පරිපූර්ණත්වය පරීක්ෂා කිරීම සඳහා මිනුම් දණ්ඩක් ලෙස ඒවායෙහි අඩංගු විය යුතු කරුණු ප්‍රධාන මාතෘකා හතරක් යටතේ දක්වති.[4] එනම්,

1. ඥාණ විභාගය පිලිබඳ ඉගැන්වීම් (Epistemology)
2. විශ්වය හා ලෝකය පිළිබඳ ඉගැන්වීම් (Cosmology)
3. සදාචාරාත්මක ඉගැන්වීම් (Morality)
4. පරම විමුක්තිය පිළිබඳ ඉගැන්වීම් (Ultimate Goal)

මින් එකක් හෝ කිපයක් අඩංගු නොවන්නේ නම් එය දර්ශනයක් ලෙස හෝ ආගමක් ලෙස ගිණිය නොහැකි බව මෙම කොටස් හතරින් මැනැවින් විස්තර වී ඇත. එහෙයින් ම එය උසස් ම ගණයේ දර්ශනයක් ලෙස සැම කෙනෙක් ම අවිවාදයෙන් ම පිළිගෙන ඇත. මෙම කොටස් 4 බුදුදහමෙහි ඇතුළත් වී ඇත්තේ කෙසේදැයි කෙටියෙන් විමසා බැලීම බෞද්ධ දර්ශනය පිළිබඳ කරනු ලබන හැඳින්වීමට අත්‍යවශ්‍ය යැයි සිතමි.

## ඥාණ විභාගය පිළිබඳ ඉගැන්වීම්

1.5 ඥාණ විභාගය යන්නෙන් ඥාණය, දැනුම, අවබෝධය සහ ඥාණය ලබා ගැනීම් වස් අනුගමනය කරන න්‍යායයන් අදහස් කෙරෙයි. මිනිස් චින්තන ඉතිහාසය තුළ අධිකාරීමය චින්තනය ප්‍රතික්ෂේප කළ එක ම ශාස්තෘවරයා වූයේ බුදුන්වහන්සේ ය. උන්වහන්සේ මිනිසාගේ ස්වාධීනත්වයත්, ස්වාධිපත්‍යයත් ආරක්ෂා කරමින් ඔහුගේ චින්තනය කිසිදු අධිකාරීමය චින්තනයකට හෝ කිසිදු බලවේගයකට යටත් නොකොට සමාජ සදාචාරාත්මක සන්දර්භය තුළ ස්වාධීනව තීරණ ගැනීමේ පූර්ණ බලය පවරා ඇති අයුරු අංගුත්තර නිකායයෙහි එන කාලාම සූත්‍රයෙන් මනාව පැහැදිළි කරයි.[5] ස්වකීය බුද්ධිය යොමුකර මනාව පරීක්ෂාකර බලා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුකළ යුතු බව බුදුන්වහන්සේ ඉහත සඳහන් සූත්‍රයේ දී මනාව පැහැදිළි කර ඇත. එසේ ම අම්බලම්ටික රාහුලෝවාද සූත්‍රයේ දී රාහුල හිමියන්ට දෙනු ලබන ඔවදන්වල දී ද පැහැදිලි කරනුයේ අධිකාරීමය චින්තනය ප්‍රතික්ෂේප කරමින් ස්වකීය බුද්ධියෙන් පරීක්ෂා කර බලා ධර්මයට අනුකූල නම්

4. Gunapala Dharmasiri, Fundamentals of Buddhist Ethics, Golden Leaves, U.S.A., 1989, P. 136
5. 'අලංහි වො කාලාමා කංඛිතුං අලං විචිකිච්ඡිතුං. කංඛනීයෙව පන වො ඨානෙ විචිකිච්ඡා උප්පන්නා. එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන මා පරම්පරාය මා ඉතිකිරාය මා පිටක සම්පදානෙන මා තක්කහෙතු මා නය හෙතු මා ආකාර පරිවිතක්කෙන මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා මා භබ්බරූපතාය මා සමණෝ නො ගරූති යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති, අථ තුම්හෙ කාලාම පජහෙය්‍යාථ' අංගුත්තර නිකාය, බු.ජ.මු., කොළඹ, 1960, පි 336

පිළිගත යුතු බවත්, ධර්මයට අනුකූල නොවේ නම් ප්‍රතික්ෂේප කළ යුතු බවත් ය.[6] ඉහත සඳහන් කෙරුණු සූත්‍ර දෙකෙහි අඩංගු කරුණු අනුව බුදුන්වහන්සේ සත්‍යය සොයාගැනීමේ දී පැහැදිලිව ම අධිකාරීමය චින්තනය, තර්කය, හේතුකොටගෙන ලබන ඥානය (මා තක්ක හේතු), න්‍යායට නොගැළපේ යැයි ලබන ඥානය (මා නය හේතු), ආදී විවිධ හේතූන් පදනම් කරගත් චින්තනයන් සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කර ඇත. එසේ ම සත්‍යය භාරගැනීමේ දී විශ්වාසය පදනම් කර ගැනීම ද ප්‍රතික්ෂේප කරනු ලැබුයේ, විශ්වාසය ඇතැම්විට සත්‍යය වීමට ද, ඇතැම් විට අසත්‍යය වීමට ද ඉඩ ඇති බව පෙන්වා දෙමිනි. බුදුදහමට අනුව පුද්ගලයා සෘජුව ම ලබන ඥාණය පමණක් නිර්දේශ කර ඇත.

1.6 මෙම ඥාණය හැඳින්වීම සඳහා පාලි නිකාය ග්‍රන්ථයන්හි යොදා ඇති ඥාණ විභාගාත්මක පද පරීක්ෂා කිරීමෙන් ද පුද්ගලයා මෙම ඥාණය සෘජුව ම ලබාගතයුත්තක් බව පැහැදිලි වෙයි.

සඤ්ඤා > සඤ්ජානාති > හඳුනාගනියි, අවදියෙන් සිටී යි.

විඤ්ඤාණ > විජානාති > අවබෝධ කරගනියි, දැන ගනි යි.

අභිඤ්ඤා > අභිජානාති > විශේෂයෙන් දැනගනි යි.

පරිඤ්ඤා > පරිජානාති > පූර්ණ අවබෝධය ලබයි. නිවැරදි ඥාණය.

පඤ්ඤා > පජානාති > ඥාණය ලබාගතිමි. අවබෝධකර ගතිමි.

මෙම සෑම පදයකින් ම හෙළිවන්නේ බුදුදහම උගන්වන ඥාණ විභාගයේ දී ඥාණය පුද්ගලයා විසින් ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කටයුත්තක් බවයි. "අත්තනාව ජානෙය්‍යාථ" යනුවෙන් තමා විසින් ම දැනගත යුතු යැයි, අවබෝධ කරගත යුතු යැයි බුදුදහම අවධාරණය කර ඇත.

1.7 බෞද්ධ ඥාණ විභාගය පිළිබඳව මහාචාර්ය කේ.එන්. ජයතිලක මහතා සිය Early Buddhist Theory of Knowledge නම් ග්‍රන්ථයේ දී විස්තරාත්මකව දක්වා ඇත. එහි දී ජයතිලක භාරතීය චින්තනයන්හි දක්නට ලැබුණු ඥාණ විභාගයන් හා බෞද්ධ ඥාණ

6. "එව මෙව ඛො රාහුල පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං පච්චවෙක්ඛිත්වා මනසා කම්මං කාතබ්බං... යදෙව ත්වං රාහුල කායෙන කම්මං කත්තුකාමෝ අහෝසි. තදෙව තෙ කාය කම්මං පච්චවෙක්ඛිතබ්බං යන්නුඛො අහං ඉදං කායෙන කම්මං කත්තුකාමො ඉදං මෙ කාය කම්මං අත්තව්‍යාබාධායපි සංවත්තෙය්‍ය. පරව්‍යාබාධායපි සංවත්තෙය්‍ය. උභයව්‍යාබාධායපි සංවත්තෙය්‍ය අකුසලං ඉදං කාය කම්මං දුක්ඛුද්‍රායං දුක්ඛ ව්‍යාකන්ති. සචෙ තවං රාහුල පච්ච වෙකඛමානො ඉදං මෙ කාය කම්මං අත්තව්‍යාබාධායපි සංවත්තෙය්‍ය.." මජ්ඣිම නිකාය 2, බු.ජ.මු., කොළඹ, 1973, පි 132

විභාගය සංසන්දනය කරමින් බෞද්ධ ඥාණ විභාගයෙහි ඇති අසමසමභාවය මනාව පෙන්නුම් කර දී ඇත.

## ලෝකය හා විශ්වය පිළිබඳ ඉගැන්වීම්

1.8 ලෝකය හා විශ්වය පිළිබඳව කරුණු දැක්වීමේ දී බුදුන්වහන්සේ පෞද්ගලික ලෝකය සහ බාහිර වාස්තවික ලෝකය යනුවෙන් සංකල්ප දෙකක් ඉදිරිපත් කළහ. බාහිර වාස්තවික ලෝකය බුදුන් වහන්සේ විග්‍රහ කරනු ලැබුයේ, විශ්වමය සන්දර්භයක් තුළය. විශ්වය යනුවෙන් උන්වහන්සේ අදහස් කර ඇත්තේ අනන්ත වූ මහා ලෝක ධාතුවයි. එම විශ්වය විස්තර කරමින් "සඳ මඩල දහසක් ඇත, සුනෙරු පර්වත රාජ්‍යයන් දහසක් ඇත, දඹදිව් දහසක් ඇත, උතුරුකුරු දිව් දහසක් ඇත, පූර්ව විදේහ දහසක් ඇත, මහා සමුද්‍රයෝ සතර දහසක් ඇත, මහා රාජ්‍යයෝ සතර දහසක් ඇත, කාම දෙව්ලෝ දහසක් ඇත, තුසිත දෙව්ලෝ දහසක් ඇත, නිර්මාණ රති දෙව්ලෝ දහසක් ඇත, පරනිම්මිත වසවත්ති දෙව්ලෝක දහසක් ඇත, බ්‍රහ්ම ලෝ ධාතු දහසක් ඇත. ආනන්දය, මෙය දහසකින් යුක්ත වූ ලෝක ධාතුවයි. මෙය සහස්සි චූලනිකා ලෝක ධාතුව ලෙස හඳුන්වයි. මෙවන් ලෝක ධාතු දහසක් එක්වීමෙන් මහා ලෝක ධාතුව සෑදෙයි."[7] යනුවෙන් බුදුදහමෙහි උගන්වන විශ්වය පිළිබඳව විස්තරය දක්වා ඇත. බුදුදහමෙහි දක්වා ඇති මෙම ලෝක විග්‍රහය නූතන විද්‍යාවෙහි උගන්වන විශ්වය පිළිබඳ ඉගැන්වීම් සමග සම්පූර්ණයෙන් ම සැසඳෙන බව මහාචාර්ය ගුණපාල මලලසේකර සහ මහාචාර්ය කේ.එන්. ජයතිලක ලිපියකින් සවිස්තරව දක්වා ඇත.[8] විශ්වය පිළිබඳව ගවේශණය කිරීම පුද්ගල ආධ්‍යාත්මික දියුණුවට හේතු නොවන බව පැහැදිලි කළ බුදුන්වහන්සේ සිය දෙවැනි සංකල්පය වූ පුද්ගලයා විසින් තනාගෙන ඇති පෞද්ගලික ලෝකය පිළිබඳව ගවේශණය කර එහි යථා තත්ත්වය අවබෝධ කරගැනීම වැදගත් බව පෙන්වා දුන්හ.

1.9 යමක් ඇසුරු කොටගෙන කෙනෙකුට ලෝකය පිළිබඳව සංවේදී වන්නේ ද, මානය ඇති වන්නේ ද, එය පෞද්ගලික ලෝකය වශයෙන් බුදුදහම පෙන්වා දී ඇත.[9] "ඇස, කණ,

7. "යාවතා ආනන්ද චන්දිමසූරියා පරිහන්ති. දිසා භන්ති විරොචනා. තාව සහස්සධා ලෝකො තස්මිං සහස්සධා ලොකෙ සහස්ස චන්ද්‍රනං. සහස්ස සූරියානං. සහස්සං සිනෙරු පබ්බත රාජයානං, සහස්සං ජම්බුදීපානං. සහස්සං අපරයෝගානං. සහස්සං උත්තර කුරුනං. සහස්සං පුබ්බවිද්හානං චත්තාරි මහා සමුද්ද සහස්සානි චත්තාරි මහාරාජ සහස්සානි සහස්සං චාතුම්මහරාජිකානං සහස්සං තාවතිංසානං සහස්සං සාමානං සහස්සං තුසිතානං සහස්සං නිම්මාන රතිනං සහස්සං පරිනිම්මිත වසවත්තිනං සහස්සං බ්‍රහ්ම ලෝකානං අයං වුච්චතානනද සහස්සිං චූලනිකා ලෝකධාතු" අංගුත්තර නිකාය, බු.ජ.මු, කොළඹ, 1960, පි 402 -4.
8. G.P. Malalasekara and K.N. Jayathilaka, Buddhism and the Race Question, Unesco, Paris 1958, P 32.
9. යෙන බො ආවුසො ලෝකස්මිං ලොක සඤ්ඤීහෝති ලොක මානි අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො" සංයුත්ත නිකාය. 4 බු.ජ.මු., කොළඹ, 1981, පි. 200.

නාසය, දිව, ශරීරය සහ මනස ඇසුරු කරගෙන සංඥා උපදවයි ද එනැන ලෝකය හටගනියි."[10], "විඤ්ඤාණයෙන් හා සංඥාවලින් යුක්ත වූ බඹයක් පමණ මෙම ශරීරය තුළ ම ලෝකය ද, ලෝකයේ ඇතිවීම ද, ලෝකයේ නැතිවීම ද, ලෝකය නැතිකිරීමේ මාර්ගය ද, පවතින බව මම දේශනා කරමි."[11] මෙසේ බුදුදහම දක්වන පෞද්ගලික ලෝකය තමා විසින් තනාගත් එකක් වන අතර එය සම්මුති වශයෙන් පවතින මුත්, පරමාර්ථ වශයෙන් නොපවතින එකක් බව විස්තර කර ඇත.

1.10 මේ සියළු ම ලෝකයන්ට බලපාන පොදු වූ ධර්මතා තුනක් ඇත. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් එම ලක්ෂණ තුන හඳුන්වා ඇත. ලෝකයත්, ඒ තුළ පවතින සියල්ලත් නිරතුරුව ම වෙනස් වන්නා වූ ප්‍රවාහයකට යටත්ව ඇත. මෙසේ නිරතුරු වෙනස්වන න්‍යායකට යටත්ව සියල්ල පවතින හෙයින්, එහි නිත්‍ය පදාර්ථයක් නොමැත. නිත්‍ය පදාර්ථයක් නොමැති නම් එනැන අතෘප්තිමත් (දුක්ඛ) මේ ලෝකයෙන් මිදීමක් හෙවත් පරම විමුක්තියක් ඇති බවත්, එය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගය බුදුදහම තුළ මනාව විස්තර කර ඇත.

1.11 අප මේ ලෝකයේ ගත කරන ජීවිතයේ යථා ස්වභාවය නම් ජාති ජරා ව්‍යාධි මරණාදී ලක්ෂණයන්ගෙන් යුක්තව මරණයට පත්වීම නැවත ඉපදීම සහ මරණයට පත්වීම මෙම සංසාර ගමනෙහි ලක්ෂණය යි. මැරී මැරී නැවත නැවත ඉපදීම සංසාරය වශයෙන් හඳුන්වයි. එය චක්‍රයක් වැනිය. ලෝකයේ පවතින නියම ස්වභාවය හෙවත් ජීවිතයේ යථා ස්වභාවය මිනිසාට යථාර්ථයෙන් තේරුම් ගැනීමට නොහැකි වී ඇත්තේ ඔහු රාග, ද්වේශ, සහ මෝහ යන කෙළෙසුන්ගෙන් පිරී පවතින හෙයිනැයි දක්වන ලදී.

වරක් බුදුන්වහන්සේ වෙත පැමිණි දෙවියෙක් ප්‍රශ්නයක් නගමින්

"ඇතුළතත් අවුල්ය. පිටතත් අවුල්ය. ලෝ වැසි සත්වයා මේ අවුල් ගොඩෙහි පැටලී සිටිති. ගෞතමයන් වහන්ස, මේ අවුල් ලිහිය හැක්කේ කාටදැයි" ඇසිය.

10. චක්ඛුනෝ බො ආවුසො ලොකස්මිං ලොක සඤ්ඤී හෝති ලොකමානි සොතෙන බො ආවුසො ලොකස්මිං ලොක සඤ්ඤි හොති ලොකමානි. ඝානෙන බො..." සංයුත්ත නිකාය. 4, බු.ජ.මු., කොළඹ, 1981 පි. 202

11. "ඉමස්මිං යෙව බ්‍යාමමත්තේ කලෙබරෙ සසඤ්ඤිම්හි සමනකෙ ලොකඤ්ච පඤ්ඤාපෙමි ලොක සමුදයංච ලොක නිරොධංච ලොක නිරෝධ ගාමිනිංච පටිපදන්ති." අංගුත්තර නිකාය 2, බු.ජ.මු., කොළඹ, 1963, පි 98